සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම - 2024 /2025

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගමේ 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දින නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 2.3 වගන්තිය	ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ලේඛනය සමඟ අවසන් වරට සකස් කර ඇති උපාය මාර්ගික සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි.	කළමනාකාරීත්වය අදහස් දක්වා නොමැත.	එම PED චක්‍රලේඛයේ ඇති විධිවිධාන වලට දැඩි ලෙස අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ)	2021 නොවැම්බර් මස නිකුත් කරන ලද අංක 01/2021 දරණ චක්‍රලේඛය, රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත	2025 මාර්තු 31 වන දිනට රුපියල් 44,858,373 ක (ධාරණ වටිනාකම) දේපළ, පිරියට සහ උපකරණවල පැවැත්ම තහවුරු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණය සමාගම විසින් සිදු කර නොතිබුණි.	කළමනාකාරීත්වය අදහස් දක්වා නොමැත.	එම PED චක්‍රලේඛයේ ඇති විධිවිධාන වලට දැඩි ලෙස අනුකූලව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් 9,379,822 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රුපියල් 11,017,710 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් 1,637,888 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රවර්තන වර්ෂයේ වාහන කුලී වියදම් නොමැති වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 ජූලි 17 වන දින, ජාලක පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක නිරතවීම සහ පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම වෙනුවෙන් සමාගම රුපියල් 57,500,000 ක මුදලක් ගෙවා තිබුණි. බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි වලට අනුව, මෙම බලපත්‍රය නිකුත් කළ දින සිට වසරක් ඇතුළත (2023 ජූලි 18) ව්‍යාපෘතිය එහි වාණිජ මෙහෙයුම් ආරම්භ කළ යුතු අතර, එම කාලසීමාව තුළ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට අපොහොසත් වුවහොත්, මෙම බලපත්‍රය අවලංගු කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. එපමණක් නොව, උක්ත බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි වලට අනුව, ව්‍යාපෘතියේ අරමුණු ලභාකර ගැනීම දැක්වෙන ප්‍රගති වාර්තාවක් වසරේ සෑම කාර්තුවක් අවසානයේදීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි.	50 MW සූර්ය බලශක්ති ව්‍යාපෘතියේ බලශක්ති බලපත්‍රය සඳහා SLSEA වෙතින් 2026 මැයි මස අවසානය දක්වා තවත් වසරක දීර්ඝ කිරීමක් ලැබී ඇත.	තවදුරටත් ප්‍රමාදයකින් තොරව වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පියවර ගත යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 අප්‍රේල් 11 වන දින පරිණත වීමට නියමිතව තිබූ (කල් පිරීමට තිබූ) රුපියල් 5,000,000 ක ස්ථාවර තැන්පතුවක් සමාගම විසින් පරිණත වීමට පෙර එනම් 2025 අප්‍රේල් 01 වන දින ඉවත් කර ගැනීම හේතුවෙන් සමාගමට රු. 74,141 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි. කෙසේ වෙතත්, මෙම තැන්පතුව කල්පිරීමට පෙර ආපසු ඉවත් කර ගැනීමට අදාල හේතු විගණනයට ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් විය.	සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා වන මෙම අතිරික්ත අරමුදල් තාවකාලිකව සමාගම විසින් ස්ථාවර තැන්පතු මත ආයෝජනය කර ඇත. 2025.03.31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය ගණනය කරන ලද්දේ එම අවස්ථාවේ තැන්පතුව සඳහා එකඟ වූ ස්ථාවර තැන්පතු පොලී අනුපාතය මතය. කෙසේ වෙතත්, 2025 මාර්තු 31 දිනට ජංගම සහ ඉතිරිකිරීම් ගිණුම්වල ඇති ශේෂයන් සමාගමට ගෙවීම සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත් නිරවුල් කිරීමට ප්‍රමාණවත් නොවූ බැවින්, ස්ථාවර තැන්පතු නියමිත කාලයට පෙර ඉවත් කර ගැනීමට සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කලින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු පොලී මුදලක් ලැබුණි. 2025 මාර්තු 31 දිනට බැංකු ශේෂය.	මුදල් කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය.

ජංගම ගිණුම් ශේෂය- මහජන බැංකුව	රු. 100,000.00
ඉතිරි කිරීම් ගිණුම් ශේෂය- ජාතික ඉතිරි කිරීමේ බැංකුව	රු, 143,370.91
2025 මාර්තු 31 දිනට මුළු බැංකු ශේෂය	රු. 243,370.91

2025 මාර්තු 31 දිනට ගෙවීමට නියමිත වියදම් ප්‍රමාණය. රු.517,900.

3.3 ව්‍යාපෘති හෝ ප්‍රග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සාම්පූර් හි මෙගාවොට් 50 ක සූර්ය බලාගාරයක් පිහිටුවීමට සමාගමට 2018 වසරේදී කැබිනට් අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත්, එම බලාගාරයේ මෙහෙයුම් කටයුතු 2025 මාර්තු 31 දින දක්වා ආරම්භ කර නොතිබුණි. සමාගම විසින් මෙහෙයුම් කටයුතු කිසිවක් සිදුකර නොතිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා පරිපාලන වියදම් ලෙස රුපියල් මිලියන 9.98 ක් වැය කර තිබුණි. 2025 මාර්තු 31 දිනට සමාගමේ සමුච්චිත රඳවාගත් අලාභය රුපියල් මිලියන 644.67 ක් වූ අතර, එහි සාම්පූර් හි ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය අත්හිටුවීමට අදාල රුපියල් මිලියන 433.88 ක් ද ඇතුළත් විය.	සමුච්චිත අලාභයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2016 වර්ෂයේදී ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය අත්හිටුවීමට කටයුතු කිරීමයි. සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම පිහිටුවන ලද්දේ ත්‍රිකුණාමලයේ ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියක් සඳහා ශ්‍රී ලංකා සහ ඉන්දීය රජයන් අතර මූලපිරීමක් ලෙස ය. පසුව, එම ස්ථානයේම සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම සඳහා ඉන්දීය රජයට නව අභිප්‍රාය පත්‍රයක් (LOI) නිකුත් කරන ලදී.	තවදුරටත් ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.